**ශ්‍රී ලාංකීය පාසල් 21 වන සියවසේ අධ්‍යාපනය වෙත ගෙන යාම අරමුණු කර ක්‍රියාවට නඟන මානව සම්පත් සංවර්ධන වැඩසටහන**

# Human Resource Development Programme to take Sri Lankan Schools to 21st Century Education

## සැසිය 3 (Session 3)

**පුනරීක්ෂණය හා 2007, 2015 නිපුණතා පාදක විෂයමාලා ආශ්‍රිත විෂයමාලා අරමුණු (Curriculum Objectives related to Competency-based Curricula)**

**පුනරීක්ෂණයඃ**

1. **විෂයමාලා චක්‍රය (Curriculum Cycle) යන පදයෙන් ඔබ තේරුම්ගෙන ඇත්තේ කුමක් ද?**
   පාසල් විෂයමාලා නවීකරණය හා සම්බන්ධ කටයුතු ප්‍රමාදයෙන් තොරව, නිශ්චිත කාල අන්තරක දී සිදු කර ගැනීම සඳහා අධ්‍යාපන ප්‍රතිපත්ති සම්පාදකයින් හඳුන්වා දී ඇති සංකල්පයක්.

2. **ඉහත සඳහන් සංකල්පය ශ්‍රී ලාංකීය අධ්‍යාපන ක්‍රමයට හඳුන්වා දුන්නේ කව් ද? කිනම් ආකාරයට ද?**
   - 1991 අංක 19 දරන පණතින් බිහි වූ **ජාතික අධ්‍යාපන කොමිසම**
   - වෂර් අටක විෂයමාලා චක්‍රයක් (Eight-Year Curriculum Cycle) හඳුන්වා දීමෙන්

3. **එම සංකල්පය ක්‍රියාත්මක වීම ආරම්භ වූයේ කවදා ද? කෙසේ ද?**
   - 1999 වෂර්යේ දී
   - 1998 වෂර්යේ **සීමිත මට්ටමින් ක්‍රියාත්මක කිරීම** අරඹා 1999 වෂර්යේ සිට දීප ව්‍යාප්තව ක්‍රියාත්මක වූ ජා.අ.ආ.යේ **ප්‍රථම විෂයමාලා ප්‍රතිසංස්කරණය** හරහා

4. **එම සංකල්පය ඉදිරියට ගියේ කෙසේ ද?**
   - ජා.අ.ආ. 2007 වෂර්යේ දී ආරම්භ කළ **නව සහශ්‍රකයේ පළමු වන විෂයමාලා ප්‍රතිසංස්කරණය** හා
   - 2015 වෂර්යේ දී හඳුන්වා දුන් නව සහශ්‍රකයේ දෙවන විෂයමාලා ප්‍රතිසංස්කරණය හරහා

5. **විෂයමාලා චක්‍රය පිළිබඳ අදහස බිඳ වැටීම ආරම්භ වූයේ කිනම් වෂර්වලට අදාළ, කිනම් හේතු නිසා ද?**
   - 2023 වෂර්යේ දී - පූවර් වෂර්වල රට මුහුණදුන් කොරෝනා වසංගතය නිසා,
   - 2024 වෂර්යේ දී - ඒ වන විට රට මුහුණදෙමින් සිටි ආථර්ක අබර්ුධය නිසා,
   - 2025 වෂර්යේ දී - 2024 වෂර්යේ අග භාගයේ සිට නවරජයක් බලයට පත්වෙමින් සිටි නිසා,
   - 2026 වෂර්යේ දී - **සිසුන් වෙනුවෙන් සම්පාදිත මොඩියුලවල දෝෂ** අනාවරණය වීම නිසා.

6. 1999ට පෙර පැවති විෂයමාලා අරමුණුවල ස්වභාවය ඔබ විස්තර කරන්නේ කෙසේ ද?
   දෙයාකාර වූ විෂයමාලා අරමුණුවලින්
   - දැනුම, ආකල්ප හා කුසලතා ලෙස විභේදනය කරන ලද **විෂය අරමුණු** පමණක් පැවතීම
   - ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියෙන් මතු කර ගන්නා **පොදු නිපුණතා** ඒ වන විට හඳුනාගෙන නොතිබීම

**7.** 1999, 2007 හා 2015 වර්ෂවල සිදු වූ විෂයමාලා ප්‍රතිසංස්කරණ, විෂයමාලා අරමුණුවල සිදු කළ වෙනස්කම් මොනවා ද?

1999 - දැනුම, ආකල්ප හා කුසලතා වෙන් වෙන් ව සළකමින් යොදා ගන්නා ලද විෂය අරමුණුවලට ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියෙන් මතු කර ගන්නා මූලික නිපුණතා පහක් (Five Basic Competencies) එකතු වීම

2007 - දැනුම, ආකල්ප හා කුසලතා වෙන් වෙන් ව සළකා බලන විෂය අරමුණු වෙනුවට එම සංරචක ඒකාබද්ධ කර දක්වන **විෂය නිපුණතා** (Subject Competencies) හඳුන්වා දීම

- මූලික නිපුණතා පහ **පොදු නිපුණතා රැසක්** බවට විකාශය කරන ලද අතර පොදු නිපුණතා, අන්තර් පුද්ගල කුසලතා හා අන්තඃ පුද්ගල කුසලතා ලෙස වගරීකරණය කිරීම

- අන්තඃ පුද්ගල කුසලතාවක් වන **චින්තන කුසලතාවල** වටිනාකම තේරුම් ගනිමින් එම කුසලතා පුද්ගල නිපුණතා කාණ්ඩයෙන් ඉවත් කර චින්තන කුසලතා නම් වූ **වෙනම ම කාණ්ඩයක් යටතේ වගර් කිරීම**

2015 - මේ වන විට ප්‍රමිති පාදක විෂයමාලා සංවධර්නය පිළිබඳ අදහස් ලොව ප්‍රචලිත වෙමින් තිබුණ ද ඒවා නොසළකා හරිමින් 2007 වර්ෂයේ දී හඳුන්වා දෙන ලද නිපුණතා පාදක විෂයමාලා ප්‍රවේශය ම ඉදිරියට ගෙන යාම

**8.** **සහානුභූති සවන් දීම** යන සංකල්පය ඔබ අථර්ගන්වන්නේ කෙසේ ද?

**Empathetic listening is the practice of fully understanding and connecting with another person's emotions and perspective through attentive, compassionate and non-judgmental listening.**

වෙනත් අයෙකු මනාව හඳුනාගෙන **ඔහුගේ / ඇයගේ චිත්තවේග (emotions) හා සිතුම් පැතුම් (perspective) සමග හොඳින් සම්බන්ධ වීම සඳහා** අවධානයෙන් යුතු ව (attentive), කරුණාභරිත ව (compassionate), විනිශ්චයන්ට නොඑළඹී (nonjudgmental) සිදු කරන සවන් දීමේ පුරුද්දයි.

**9.** **ව්‍යවසායකත්වය** යන සංකල්පය ඔබ හඳුන්වන්නේ කෙසේ ද?

~~පහත සඳහන් ගුණාංගවලින් යුතු~~ වූ කිසියම් පුද්ගලයෙකු මූල්‍යමය වූ හෝ සමාජයීය වූ හෝ වටිනාකමක් සාක්ෂාත් කර ගැනීමේ අරමුණෙන් නව අදහසක් පෙරදැරි කර සිදු කරනු ලබන අවදානම් දැරීමේ ක්‍රියාවලියකි.

I කුතුහලය (curiosity)

II පරීක්ෂණ කිරීමේ කැමැත්ත (desire to experiment)

III අනුවතර්නය වීමේ හැකියාව (adaptability)

IV ඉක්මණින් ද ඵලදායිව ද තීරණ ගැනීමේ හැකියාව (decisiveness)

V ස්වයං අවබෝධය (self-awareness)

VI අවදානම් දැරීමේ හැකියාව (ability to take risks)

VII පසුබෑම් ඉවසීමේ හැකියාව (tolerance) / වැටුණ විට නැගිටීමේ හැකියාව (resilience)

VIIIනොපසුබට උත්සාහය / අත් නොහැරීම (persistence)

IX නිමර්ාණශීලි චින්තනය (creative thinking)

X දීඝර්කාලීන අවධානය (long-term focus)

**2007 විෂයමාලා ප්‍රතිසංස්කරණයෙන් පසු සිදු වූ විෂයමාලා අරමුණුවල විකාශයඃ**

1. විවිධ යුගවල අවශ්‍යතාවන්ට ගැලපෙන පරිදි විෂයමාලා අරමුණු විකාශය වූ ආකාරය පෙන්වා දෙන ආකෘති මොනවා ද?
   - අරමුණු ආකෘතිය (Objectives Model)
   - නිපුණතා පාදක ආකෘතිය (Competency-based Model)
   - ප්‍රමිති පාදක ආකෘතිය (Standards-based Model
   - ඉගෙනුම් පල පාදක ආකෘතිය (Learning Outcomes-based Model)

2. නව සහශ්‍රකය ආරම්භ වී වසර 15ක් පමණ ගත වන අවස්ථාවේ දී පෙරට පැමිණ තිබුණ විෂයමාලා සංවධර්න ආකෘතිය කුමක් ද?
   ප්‍රමිති පාදක ආකෘතිය Standards Based Model

3. ප්‍රමිති පාදක ආකෘතිය ක්‍රියාවට නැගීම සඳහා යෝජනා කර තිබූ ක්‍රමවිධි මොනවා ද?
   - **මූලික විදුහල්පතිත්ව පාඨමාලාව හා උසස් විදුහල්පතිත්ව පාඨමාලාව** (Basic and Advanced Principalship Programme)
   - **පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක තහවුරුව** (School Quality Assurance) නම් වූ වැඩසටහන

4. **පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක තහවුරුව (School Quality Assurance)** යටතේ ප්‍රමිති / අවශ්‍යතා / නිර්ණායක / දර්ශක තීරණය කර ලකුණු ලබා දෙන ආකාරය

**ඇගයීම් ක්ෂේත්‍රය 5 - ශිෂ්‍ය ශුභසාධනය**

ප්‍රමිතිය - විවිධ ~~ශුභසාධන~~ වැඩසටහන් ඉදිරිපත් කරමින් සිසුන්ගේ මානසික හා ශාරීරික සංවර්ධනය ශක්තිමත් කරයි.

අවශ්‍යතා - ශිෂ්‍ය මාර්ගෝපදේශන හා උපදේශන සේවා හඳුන්වා දීම
ශුභසාධන සේවා මගින් ශිෂ්‍ය මූලික අවශ්‍යතා ඉටු කිරීම
ශිෂ්‍ය සෞඛ්‍යය හා ~~පෝෂණ තත්ත්ව~~ සනීපාරක්ෂාව (Health and Hygiene) තහවුරු කිරීම
**ශිෂ්‍ය ආරක්ෂාව තහවුරු කිරීම**

නිර්ණායක - ආපන ශාලාව මැනවින් පවත්වා ගෙන යාම
ළමා අපචාර/අපයෝජන වළක්වා ගැනීම
**ආපදා කළමනාකරණය විධිමත් ව සිදු කිරීම**

දර්ශක - ආපදා දැන්වීමේ ක්‍රමයක් පැවතීම
ආපදා පෙරහුරු පවත්වා තිබීම

ලකුණු - විශිෂ්ටයි, ඉතා හොඳයි, හොඳයි, සාමාන්‍යයි, සංවර්ධනය විය යුතුයි, ඉතා ඉක්මණින් සංවර්ධනය විය යුතුයි.

**I විෂයමාලා සංවර්ධනය සඳහා යොදා ගන්නා ප්‍රමිති පාදක ආකෘතිය**

පැහැදිලි ව නිර්වචනය කරනු ලබන ප්‍රමිති ඔස්සේ සිදු කරනු ලබන විෂයමාලා සැලසුම්කරණ එළඹුමකි. විවිධ ඉගෙනුම් අවධි ඔස්සේ සිසුන් දැන ගත යුත්තේ මොනවා ද? ඔවුන්ට කළ හැක්කේ මොනවා ද? යන්න විස්තර කරන වගන්තිවලින් මේ ප්‍රමිති සකස් ව තිබේ.
එකඟතාවට පත් ව තිබෙන ගුණාත්මක මට්ටම් හා කාර්ය සාධන මට්ටම් සියලු ම ඉගෙනුම්ලාභීන් ළඟාකර ගන්නා බව තහවුරු කිරීම මේ එළඹුමේ අභිප්‍රාය වෙයි.

1. ප්‍රමිති පාදක විෂයමාලාවක මුලින් ම සිදු වන්නේ අධ්‍යාපනික ප්‍රමිති හඳුනා ගැනීමයි. මේ ප්‍රමිති අපේක්ෂිත ඉගෙනුම් පල විස්තර කරයි. දැනුම, ආකල්ප, වටිනාකම්, කුසලතා, කාර්ය සාධන අපේක්ෂණ වැනි දෑ මේවාට ඇතුළත් විය හැකි ය.
2. විෂයමාලා අන්තර්ගතය සංවිධානය කර ඇත්තේ මෙම ප්‍රමිති ළඟා කර ගැනීම සඳහා සිසුන්ට උදව් වන ආකාරයෙනි.
3. ප්‍රමිති ඉගැන්වීමට හා ඇගයීමට මග පෙන්වයි.
   අපේක්ෂිත ප්‍රමිති සිසුන් ළඟා කර ගන්නවා ද යන්න අඛණ්ඩ ව ගුරු අවධානයට ලක් වෙයි.
4. පූර්වයෙන් තීරණය කර තිබෙන ප්‍රමිති ඔස්සේ සිසු සාධනය විනිශ්චයට ලක් වෙයි.
   සිසුන් අතර සැසඳීම් මෙහි දී සිදු නොවේ.

**ප්‍රමිති යනු මොනවා ද?**

අපේක්ෂිත ඉගෙනුම කුමක් ද යන්න පෙන්වා දෙන පැහැදිලි වගන්ති

නිදසුන්

- ලේඛනය ඔස්සේ ඵලදායි ව අදහස් සන්නිවේදනය කරයි.
- සැබෑ ජීවිතයට අදාළ ගණිත ගැටලු විසඳයි.
- විද්‍යාත්මක විමශර්න කුසලතා සිසුන් ප්‍රදශර්නය කරයි.

ප්‍රමිති ලෙස බොහෝ විට ඉදිරිපත් කෙරෙන කාරණා:

- සිසුන් දැනගත යුත්තේ මොනවා ද?
- සිසුන්ට කළ හැකි විය යුත්තේ මොනවා ද?
- අපේක්ෂා කරන කායර් සාධන මට්ටම කුමක් ද?

**ප්‍රමිති පාදක එළඹුමේ ප්‍රධාන ලක්ෂණ**

1. පැහැදිලි ඉගෙනුම් අපේක්ෂණ
   සිසුන් සාක්ෂාත් කළ යුත්තේ මොනවා ද යන්න සියලුදෙනාට පැහැදිලි ය.
2. ගැලපීම
   විෂයමාලාව, ඉගැන්වීම, ඉගෙනුම් ක්‍රියාකාරකම්, පෙළපොත්, තක්සේරු හා ඇගයීම් ක්‍රම ප්‍රමිතිවලට ගලපා ඇත.
3. මිනුමට ලක කළ හැකි ප්‍රතිඵල
   නිරීක්ෂණයට මෙන් ම මිනුමට ලක් කළ හැකි ආකාරයෙක් ඉගෙනීම ඉදිරිපත් කර තිබේ.
4. වගවීම්
   ප්‍රමිති වෙත යාමට ඉගෙනුම් ලාභීන්ට උදව් කිරීම පාසල් හා ගුරුවරුන්ගේ වගකීම වෙයි.
5. සංසතතාව
   සියලු ම පාසල්වල සිසුන් පොදු මිනුම් දශර්ක (common benchmarks) සාක්ෂාත් කර ගනු ඇතැයි අපේක්ෂා කෙරෙයි.
6. අඛණ්ඩ තක්සේරුව
   ප්‍රමිති වෙත යාමේ ප්‍රගතිය නියාමනය සඳහා භාවිත කෙරෙයි.

**ප්‍රමිති පාදක විෂයමාලා සංවධර්න ක්‍රියාවලිය**

**II ප්‍රමිති පාදක විෂයමාලා සංවධර්න ක්‍රියාවලියේ මූලික ලක්ෂණ**

පිළිගත හැකි කායර් සාධන මට්ටම් ළඟා කර ගැනීම සිසුන්ට පහසු වන පරිදි ඉගෙනුම, ඉගැන්වීම හා ඇගයීම යන සියල්ල දිශාභිමුඛ කරමින්, පැහැදිලි ව නිවර්චනය කර තිබෙන අධ්‍යාපනික ප්‍රමිති ඔස්සේ සංවධර්නය කර තිබෙන විෂයමාලා විශේෂයකි

**ප්‍රමිති පාදක විෂයමාලා සංවධර්න ආකෘති, ඉගෙනුම් පල පාදක හා නිපුණතා පාදක ආකෘතිවලට දක්වන සම්බන්ධතාව**

**සමානතා**

- පැහිදිලි අපේක්ෂණ

- මිනුමට ලක් කළ හැකි ඉගෙනුම
- වගවීම
- සිසු සාධනය

**වෙනස්කම්**

- ප්‍රමිති පාදක අධ්‍යාපනය - එකඟතාවට එළඹ තිබෙන කායර් සාධන ප්‍රමිති අවධාරණය කරයි.
- නිපුණතා පාදක අධ්‍යාපනය - එදිනෙදා ජීවිතයේ ප්‍රදශර්නය කරන සමෝධානික හැකියා අවධාරණය කරයි.
- පල පාදක අධ්‍යාපනය - අවසාන ඉගෙනුම් පල හා ඉගෙනුම් ලාභියාගේ සාථර්කත්වය අවධාරණය කරයි.

**ප්‍රමිති පාදක විෂයමාලා සැලසුම්කරණ ක්‍රියාවලිය**

- පියවර 1
  ප්‍රමිති හඳුනා ගැනීම
  අදාළ අධ්‍යාපන බලධාරීන් ජාතික හෝ ආයතනික ප්‍රමිති තීරණය කරයි.
- පියවර 2
  ඉගෙනුම් පල සංවධර්නය
  ප්‍රමිතිවලින් සුවිශේෂ ඉගෙනුම් පල ව්‍යුත්පන්න කරයි.
- පියවර 3
  අන්තගර්තය හා ඉගෙනුම් අද්දැකීම් තේරීම
  ප්‍රමිති සාක්ෂාත්කරණය සඳහා ඉගෙනුම්ලාභීන්ට උදව් කිරීම සඳහා අන්තගර්තය හා ක්‍රියාකාරකම් තෝරයි.
- පියවර 4
  තක්සේරු ක්‍රමපිළිවෙත් තීරණය කිරීම
  ප්‍රමිති සාක්ෂාත්කරණය මිනුමට ලක් කිරීම සඳහා ඇගයීම් ක්‍රමපිළිවෙත් සකස් කරයි.
- පියවර 5
  නැවත විමසා බැලීම හා වැඩිදියුණු කිරීම
  ශිෂ්‍ය සාධනය පිළිබඳ දත්ත විෂයමාලාව හා ප්‍රමිති සංවධර්නය සඳහා යොදා ගනීයි

**ප්‍රමිති පාදක ආකෘතිය, අරමුණු ආකෘතියෙන් වෙනස් වන ආකාරය**

| **අරමුණු ආකෘතිය** | **ප්‍රමිති පාදක ආකෘතිය** |
|---|---|
| ඉගැන්වීම් අරමුණු අවධාරණය කරයි. | කායර් සාධන ප්‍රමිති අවධාරණය කරයි. |
| බොහෝ විට විෂය අන්තගර්තය කේන්ද්‍ර කර ගනීයි. | කායර් සාධනය කේන්ද්‍ර කර ගනීයි. |
| ගුරු ආවරණයට ලක් වන විෂය අන්තගර්තය වැදගත් ය. | ශිෂ්‍ය සාධනය වැදගත් ය. |
| ඇගයීම් යටතේ මතකය මිනුමට ලක් වෙයි. | ප්‍රමිති සාක්ෂාත් වූ මට්ටම මිනුමට ලක් වෙයි. |

| | |
|---|---|
| අරමුණු වෙනස් විය හැකි ය. | පොදු ප්‍රමිති පවත්වා ගනීයි. |

**නිපුණතා පාදක හා පල පාදක එළඹුම් අතර සම්බන්ධතාව**

ප්‍රමිති පාදක එළඹුම් පසුව කලඑළියට ආ නව එළඹුම් බිහි කර ඇත.

**ආකෘති දෙක ම අවධාරණය කරන ලක්ෂණ**

- පැහැදිලි අපේක්ෂණ
- මිනුමට ලක් කළ හැකි ඉගෙනුම
- වගවීම
- ශිෂ්‍ය සාධනය

**ආකෘති අතර වෙනස්කම්**

- ප්‍රමිති පාදක අධ්‍යාපනය එකඟතාවට පැමිණ තිබෙන කායර් සාධන ප්‍රමිති අවධාරණය කරයි.
- නිපුණතා පාදක අධ්‍යාපනය පුරුදු ඔස්සේ ප්‍රදශර්නය කරන සමෝධානික හැකියා
- පල පාදක අධ්‍යාපනය අවසන් ඉගෙනුම් පල ඉගෙනුම් ලාභියාගේ සාථර්කත්වය

**ප්‍රමිති පාදක ආකෘතිය, අරමුණු ආකෘතියෙන් වෙනස් වන ආකාරය**

| **අරමුණු ආකෘතිය** | **ප්‍රමිති පාදක ආකෘතිය** |
|---|---|
| ඉගැන්වීම් අරමුණු අවධාරණය කරයි. | කායර් සාධන ප්‍රමිති අවධාරණය කරයි. |
| බොහෝ විට විෂය අන්තගර්තය කේන්ද්‍ර කර ගනීයි. | කායර් සාධනය කේන්ද්‍ර කර ගනීයි. |
| ගුරු ආවරණයට ලක් වන විෂය අන්තගර්තය වැදගත් ය. | ශිෂ්‍ය සාධනය වැදගත් ය. |
| ඇගයීම් යටතේ මතකය මිනුමට ලක් වෙයි. | ප්‍රමිති සාක්ෂාත් වූ මට්ටම් මිනුමට ලක් වෙයි. |
| අරමුණු වෙනස් විය හැකි ය. | පොදු ප්‍රමිති පවත්වා ගනීයි. |

**නිපුණතා පාදක හා පල පාදක එළඹුම් අතර සම්බන්ධතාව**

ප්‍රමිති පාදක එළඹුම් පසුව කලඑළියට ආ නව එළඹුම් බිහි කර ඇත.

**ආකෘති දෙක ම අවධාරණය කරන ලක්ෂණ**

- පැහැදිලි අපේක්ෂණ
- මිනුමට ලක් කළ හැකි ඉගෙනුම
- වගවීම
- ශිෂ්‍ය සාධනය

**ආකෘති අතර වෙනස්කම්**

- ප්‍රමිති පාදක අධ්‍යාපනය එකඟතාවට පැමිණ තිබෙන කායර් සාධන ප්‍රමිති අවධාරණය කරයි.
- නිපුණතා පාදක අධ්‍යාපනය පුරුදු ඔස්සේ ප්‍රදශර්නය කරන සමෝධානික හැකියා

- පල පාදක අධ්‍යාපනය අවසන් ඉගෙනුම් පල ඉගෙනුම් ලාභියාගේ සාථර්කත්වය

5. **ප්‍රමිතිපාදක විෂයමාලාවල වාසි (**කායර් සාධන ප්‍රමිති අවධාරණය කරයි.)
    - අපේක්ෂණ පැහැදිලි ව සටහන් කර ඇත.
    - ගුරු වගවීම පහසු කරයි.
    - අධ්‍යාපනයේ ගුණාත්මක බව පවත්වා ගෙන යාමට උදව් කරයි.
    - ඉගෙනුම් ලාභීන් පිළිබඳ ප්‍රගති නියාමනය පහසු කරයි.
    - පොදු අපේක්ෂණ හරහා සාධාරණත්වය ඉහළ නංවා ඇත.
    -

**අවාසි / විවේචන**

- ප්‍රමිති අවශ්‍ය පමණට වඩා දැඩි විය හැකිය.
- පරීක්ෂණ (tests) අනවශ්‍ය පරිදි ඉහළ යා හැකි ය.
- ගුරුවරුන් පරීක්ෂණ ඉලක්ක කර ඉගැන්විය හැකි ය.
- නිමර්ාණශීලිත්වය හා නම්‍යතාව (flexibility) පහළ යා හැකි ය.
- මිනුමට ලක් කළ හැකි ඉගෙනුම් පල කෙරෙහි දක්වනු ලබන අනිසි අවධානය ගැඹුරු මානව සංවධර්නය අතපසු කළ හැකි ය.